ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

සංස්ථාපිත ආදායම් වාර්තාව පිරවීම සඳහා උපදෙස් මාලාව

තක්සේරු වර්ෂය
2025/2026

ආදායම් වාර්තාව සම්පූර්ණ කිරීමට පෙර, ඔබ විසින් මෙම උපදෙස් මාලාව පරිශීලනය කරන්න. වැඩිදුර විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තු (IRD) වෙබ් අඩවිය - www.ird.gov.lk හරහා ලබාගත හැකිය.

1. හැඳින්වීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93(1) වගන්තිය ප්‍රකාරව, සෑම තැනැත්තෙකුම සෑම තක්සේරු වර්ෂයක් අවසාන වීමෙන් පසුව එළඹෙන මාස අටකට නොවැඩි කාලයක් තුළ එම තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතු වේ. ඒ අනුව, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය (2025/2026) සඳහා වන ආදායම් වාර්තාව 2026 නොවැම්බර් 30 දින හෝ එදිනට පෙර ගොනු කළ යුතු වේ.

දේශීය ආදායම් පනතේ, 126(2) වන වගන්තියේ විධිවිධාන පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තාව සඳහා වන ආකෘතිය, වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම්, වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ ගොනු කළ යුතු ආකාරය නිශ්චිත ව දක්වනු ලැබිය හැකිය.

ඒ අනුව, අංක Asmt CIT 002A ආකෘතිය සහ අංක Asmt – CIT- 002B ආකෘතියෙන් දැක්වෙන උපලේඛන ඇතුළුව අංක Asmt CIT 001 ආකෘතිය, හවුල් ව්‍යාපාර හැර යම් අස්ථිත්වයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආදායම් වාර්තාව (සංස්ථාපිත ආදායම් වාර්තාව) වේ. එබැවින්, පහත සඳහන් කර ඇති අස්ථිත්ව, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඉහතින් සඳහන් කළ ආකෘති පත්‍ර අනුව ආදායම් වාර්තාව සැපයීමේදී දේශීය ආදායම් පනතේ විධිවිධාන සමග අනුගත ව වාර්තාව ගොනු කළ යුතුය.

1.1. සංස්ථාපිත ආදායම් වාර්තාව ලබාදිය යුතු අස්ථිත්ව

(අ) වාසික හෝ නිර්වාසික සීමිත වගකීම් සහිත සමාගම්
(ආ) වාසික හෝ නිර්වාසික භාර
(ඇ) පුණ්‍ය ආයතන
(ඈ) ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල්
(ඉ) රාජ්‍ය නොවන සංවිධාන
(ඊ) රාජ්‍ය සංස්ථා
(උ) සමාජශාලා, සමිති හෝ සංගම්

(උ) ඕනෑම රජයේ ආයතනයක්
(එ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල, අර්ථසාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල, සමාපන අරමුදල හෝ පාරිතෝෂික අරමුදල
(ඒ) හවුල් ව්‍යාපාර හැර වෙනත් ඕනෑම අස්ථිත්වයක්

2. සංස්ථාපිත ආදායම් වාර්තා සඳහා අනුමත ආකෘති පත්‍ර

අනුමත කළ ආකෘති පත්‍ර පහත පරිදි සකස් කර ඇත.

(අ) ආදායම් වාර්තාව - අ කොටස
- (i) කොටස - 01: ලැබීම් හා ලාභ ප්‍රකාශය
- (ii) කොටස - 02: ප්‍රකාශනය
- (iii) ආදායම් වාර්තාව සඳහා උපලේඛන

(ආ) මූල්‍ය තොරතුරු - ආ කොටස
- (i) උපලේඛනය - 08 : ගණනය කිරීමේ පත්‍රිකා
- (ii) උපලේඛනය - 09 : මූල්‍ය තොරතුරු
- (iii) උපලේඛනය -10 : වර්ෂය තුළ දී ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරන ලද, විදේශ රටවලදී කරන ලද විදේශ මූලාශ්‍ර වලින් ලද ව්‍යාපාර ආදායම් හා සේවා වල ලැබීම් සහ ලාභ පිළිබඳ සාරාංශය

වාර්තාවේ අ කොටස උපලේඛන එකොළහකින් සමන්විත වේ. එනම් උපලේඛන 1, 2, 2ආ, 3, 4, 5, 6 (6අ+6ආ), 7, 7අ, 7ආ වේ. එම සියලුම උපලේඛන භාරදීම අනිවාර්ය වේ. එම අනිවාර්ය උපලේඛන, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද ආදායම් වාර්තාවේ අනුමත කළ ආකෘති පත්‍රවල අත්‍යවශ්‍ය කොටසකි. එසේ වුවද, උපලේඛන 1, 2ආ, 3, 5, 6 (6අ+6ආ), 7අ, හා 7ආ ආදායම් වාර්තා ගොනු කිරීමේදී අදාළ නොවේ නම්, එම උපලේඛන ඔබ විසින් භාරදීමට අවශ්‍ය නොවේ.

එවැනි අවස්ථාවකදී, කරුණාකර උපලේඛනවල පළමු පිටුවේ (ආදායම් වාර්තාවේ අ කොටසෙහි) දී ඇති වගුවේ උපලේඛනයේ අදාලත්වය "(X)" ලෙස ලකුණු කරන්න. එම වගුවේ "(X)" ලෙස ලකුණු කොට, එය එම ආදායම් වාර්තාව සමඟ භාරදෙන ලද තැනැත්තා, එම අනිවාර්ය උපලේඛන භාරදුන් තැනැත්තකු ලෙස සලකනු ලැබේ. එසේ වුවද, ඉහත සඳහන් කළ වගුව සමග උපලේඛන 2, 4 හා 7 භාරදීම අනිවාර්ය වේ.

දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගිණුම්කරණ ලාභය ගලපමින් සකස් කරන ලද ඔබගේ බදු ආගණනය කිරීම ඔබ විසින් අමුණා ඇත්නම්, මෙම තක්සේරු වර්ෂය සඳහා උපලේඛන 8 භාරදීම අනිවාර්ය නොවේ. එසේ වුවද, මූල්‍ය තොරතුරුවල උපලේඛන සම්පූර්ණ කර වාර්තා ආකෘති පත්‍රවලට අමුණන ලෙස ඔබට උපදෙස් දෙනු ලැබේ.

යම් අවස්ථාවකදී, ආදායම් වාර්තාවේ යම් කොටුවකට වටිනාකම වෙනත් උපලේඛන සමග සම්බන්ධ වී ඇති විට, අදාළ උපලේඛන සම්පූර්ණ කළ යුතු අතර වාර්තාව සමග සැපයිය යුතුය.

2.1. 02 වන කොටස - වාර්තාවේ අ කොටස (අනුමත ගණකාධිකාරිවරයකු ද හෝ වෙනත් යම් තැනැත්තාගේ තොරතුරු)

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතින් සංශෝධනය කර ඇති පරිදි, දේශීය ආදායම් පනතෙහි 126(5) වන වගන්තිය ප්‍රකාරව, අනුමත කළ ගණකාධිකාරිවරයකු ද ඇතුළු, යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස්කර ඇති අවස්ථාවකදී එම තැනැත්තා, එම වාර්තාව සකස් කිරීමේදී ඔහු සම්බන්ධ වූ ප්‍රමාණය, පරීක්ෂා කරන ලද ලේඛන සහ පදනම් කරගත් තොරතුරු දක්වමින් වෙනම සහතික කළ යුතුය. ඒ අනුව, ඔබ විසින් අදාළ කොටුවෙහි "✓" ලකුණ යෙදීම අවශ්‍ය වේ. ඔබ "ඔව්" යන්න සඳහන් කළ කොටුවෙහි "✓" යන්න යොදා නිබේ නම්, 2 වන කොටසෙහි එම තැනැත්තාගේ විස්තර පිරවීමට අවශ්‍ය වන අතර ඔබගේ වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කළ එම තැනැත්තා විසින් නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කල යුතු වේ.

ඔබගේ වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කිරීමට එක් තැනැත්තකුට වඩා සම්බන්ධ වී ඇති අවස්ථාවකදී, කරුණාකර 2 වන කොටසේ අ කොටස යටතේ අවශ්‍ය කරන විස්තර ඇතුළත් කිරීමට වෙනම පත්‍රිකාවක් භාවිතා කළ යුතු අතර, සියලුම සහතික එම පත්‍රිකාව සමග ආදායම් වාර්තාවට ඉදිරිපත් කල යුතු වේ. තවද, එම සහතික කිරීම්, ඔබගේ වාර්තාවේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබිය යුතු වේ.

2.2 02 වන කොටස - වාර්තාවේ ආ කොටස (බදු ගෙවන්නාගේ ප්‍රකාශය)

දේශීය ආදායම් පනතේ 126(4) වන වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ නිසි බලය ලද අනුයෝජිතයා, වාර්තාව එහි නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කරමින් [සමාගමක් සඳහා කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ/ලේකම් හෝ ප්‍රධාන නිලධාරියා හෝ වෙනත් අස්ථිත්වයක් සඳහා නියෝජිතයකු, (දේශීය ආදායම් පනතේ 146 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි)] ආදායම් වාර්තාවේ 2 වන කොටසේ ආ කොටස යටතේ ඔහුගේ/ඇගේ නම හා තනතුර සඳහන් කළ යුතුය.

දේශීය ආදායම් පනතේ 128 වන වගන්තිය ප්‍රකාරව, දේශීය ආදායම් පනත යටතේ යම් තැනැත්තකු හෝ ඔහු වෙනුවෙන් සපයනු ලැබූ ලෙස සැලකෙන සෑම වාර්තාවකට, ප්‍රකාශයට හෝ ආකෘතියකට පටහැනිව යමක් ඔප්පු කරනු ලැබුවේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තාගේ බලය මත එය සපයනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, එම වාර්තා, ප්‍රකාශ හෝ ආකෘති අත්සන් කරන යම් තැනැත්තකු එහි අඩංගු සියලු කරුණු පිළිබඳව දැනුවත් බවට සැලකිය යුතුය.

ඔබ ආදායම් වාර්තාව ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කරන විට, උපලේඛනවල දක්වා ඇති කොටුවලට අදාල අගයන් නිවැරදිව ඇතුළත් කිරීම ප්‍රමාණවත් වේ. පද්ධතිය මඟින් ස්වයංක්‍රීයවම ගණනය කිරීම සිදු කර, බදු වාර්තාවේ ඊට අනුරූප කොටු පුරවනු ඇත. එබැවින්, බදු වාර්තාවේ අදාළ කොටස් වල අගයන් අතින් ගණනය කිරීමට හෝ ඇතුළත් කිරීමට අවශ්‍ය නොවේ.

2.3 පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය.

2021.03.02 දිනැති අංක 2217/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද පැවරුම් මිල නියෝග වල 6 වන නියෝගය ප්‍රකාරව, දේශීය ආදායම් පනතේ 76 හා 77 වගන්තිවල සඳහන් පරිදි ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ජාත්‍යන්තර ගනුදෙනුවල නිරත වන හෝ ගැසට් නිවේදනයේ 1 වන නියෝගයේ දක්වා ඇති අවශ්‍යතා සපුරන, ආශ්‍රිත ව්‍යවසායන් සමඟ ජාත්‍යන්තර නොවන ගනුදෙනු වල නිරත වන තැනැත්තන් ආදායම් වාර්තාව සමඟ පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය භාරදීම අවශ්‍ය වේ. එම පැවරුම් මිල අනාවරණ ආකෘති

පත්‍රය PDF හෝ JPG ආකෘතිවලින් මෙන්ම Excel පැතුරුම් පත් ආකෘතියෙන් ද භාරදීම අනිවාර්ය වේ. ඉහතින් සඳහන් කළ ආකෘති පත්‍රය සහ එහි Excel පැතුරුම් පත ("අ" සහ "ආ" කොටස් ලෙස) දේශීය ආදායම් වෙබ් අඩවියේ ආදායම් වාර්තා යටතේ දක්වා ඇත.

3. ආදායම් වාර්තා ආකෘති පත්‍රය සඳහා වාර්තාව සම්පූර්ණ නිශ්චිතව ගොනු කළ යුතු ඇමුණුම්

- **(i)** විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන
- **(ii)** නිශ්චිතව දක්වන ලද ආකෘති පත්‍රවල 8 වන උපලේඛනය හෝ බදු ආගණන ප්‍රකාශය
- **(iii)** රඳවාගැනීමේ බදු හෝ අත්තිකාරම් ආදායම් බදු (ඉල්ලුම්කර ඇත්නම්) CSV ආකෘතියට සකස් කළ සත්‍යාපනය කරන ලද (පරීක්ෂා කරන ලද) උපලේඛන (අයිතම සංඛ්‍යාව 20 ට වඩා වැඩි වන්නේ නම්, උඩුගත කිරීම අනිවාර්ය වේ.)
- **(iv)** ගෙවීමක් සඳහා වාර්තාව හෝ වාර්තාවේ කොටසක් සකස් කළ තැනැත්තන් විසින් නිකුත් කළ සහතික
- **(v)** PDF හෝ JPG ආකෘතියෙන් වූ පැවරුම් මිල අනාවරණ ආකෘති පත්‍රය සහ එහි Excel පැතුරුම් පත (අදාළ වේ නම්)
- **(vi)** යම් වෙනත් අවශ්‍ය කරන ලේඛන හා සහතික

යම් තැනැත්තකු අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අනුමත කළ ආකෘති පත්‍රවල සම්පූර්ණ කළ උපලේඛන, ගෙවීමක් කිරීම තුළින් වාර්තාව හෝ වාර්තාවේ කොටසක් පිළියෙල කළ තැනැත්තාගේ සහතිකය (අදාළ වේ නම්) නොමැතිව හෝ ආදායමේ ඇස්තමේන්තුගත අගයන් සහිත වාර්තාවක් නොමැතිව භාරදීම දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා ආදායම් වාර්තාව සපයා නොමැති බවට සලකනු ලැබේ.

4. සුදුසුකම් ලබන ගෙවීම් හා සම්බන්ධ වැදගත් සටහන් (උපලේඛනය 3)

දේශීය ආදායම් පනතේ 52 වන උපවගන්තිය අනුව, 3 වන වගන්තිය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් අස්ථිත්වයක බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී, මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් අඩු කළ හැකි ය.

අස්ථිත්වයක් විසින් බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී සුදුසුකම් ලබන ගෙවීම් වශයෙන් අඩු කළ හැකි, **<u>ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට</u>** මුදලින් හෝ වෙනත් ආකාරයකින් සිදු කරන ලද පරිත්‍යාගයක්, අදාළ තක්සේරු වර්ෂයේ සමස්ත බදු අය කළ හැකි ආදායමෙන් අඩු කළ පසුව, අඩු කිරීමට නොහැකි වූ ඉතිරි ප්‍රමාණය ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයට සහ ඉන් පසුව එළඹෙන යම් අනුයාත වර්ෂ වෙත ඉදිරියට ගෙන යා හැකි ය (2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව 2025.04.01 වන දින සිට ක්‍රියාත්මක ය).

5. ආදායම් වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු තොරතුරු

5.1 බදු අයකළ හැකි ආදායම

දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය යටතේ තක්සේරු වර්ෂයක් සඳහා කිසියම් අස්ථිත්වයක බදු අය කළ හැකි ආදායමට එළඹීමට මෙකී පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් කර ඇති මුළු සුදුසුකම් ලබන ගෙවීම් අඩු කළ යුතු ය.

5.2 විශේෂ අනුප්‍රමාණ යටතේ බදු අයකළ හැකි ආදායම මත බද්ද (04 වන උපලේඛනය) - 80 කොටුව

2025/2026 තක්සේරු වර්ෂය සඳහා ලැබීම් සහ ලාභ මත අදාළ කර ගත් බදු අනුප්‍රමාණයන් පහත පරිදි වේ.

(අ) සමාගම් – 30% (ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලබන ලැබීම් ඇතුළත්ව)

(ආ) භාරය – 30%

(ඇ) ඒකක භාර සහ අන්‍යෝන්‍ය අරමුදල් - 30%

භාරයක හෝ ඒකක භාරයක සහ අන්‍යෝන්‍ය අරමුදලක බදු අය කළ හැකි ආදායමට, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලබන ලැබීම් ඇතුළත් වන අවස්ථාවකදී, එම ලැබීම් මත 10% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය

(ඈ) රාජ්‍ය නොවන සංවිධාන (දේශීය ආදායම් පනතේ 68 වන වගන්තිය යටතේ සඳහන් පරිදි ප්‍රදාන ආකාරයට ලද, පරිත්‍යාග දායකත්ව හෝ වෙනත් යම් ආකාරයකින් ලද මුදල් ප්‍රමාණ ඇතුළත්ව) – 30%

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා වන ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී - 15%

(ඊ) යම් විදේශ මූලාශ්‍රයකින් ලැබෙන හෝ උපයනු ලබන ලැබීම් සහ ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන හෝ උපයනු ලබන අවස්ථාවක දී බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් -15%

(උ) ඔට්ටු හා සූදු – 45%

(ඌ) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය සහ විකිණීම – 45%

(එ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අර්ථසාධක, විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික අරමුදල් සහ සමාපන අරමුදල් සඳහා වන බදු අනුප්‍රමාණ පහත පරිදි වේ.

1. දෙවන අයිතමයේ සඳහන් ලැබීම් සහ ලාභ හැර අමතරව අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක, හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක බදු අය කළ හැකි ආදායම මත 14% ක බදු අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.
2. භාණ්ඩාගාර බැඳුම්කරවලින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක්, හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක් වෙත ලැබුණු හෝ ඒවායින් උපයන ලද ලැබීම්

වල සහ ලාභවල කොටසක් මත 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.

3. කෙසේ වුව ද, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අනුමත කරනු ලැබූ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ අනුමත කරනු ලැබූ සමාපන අරමුදලක් විසින් සුදුසුකම්ලත් බැඳුම්කරවල ආයෝජනය කර ඇත්තේ නම් සහ එවැනි යම් අරමුදලක් 2023 ජූලි මස 1 වන දිනැති යෝජනා සම්මතය මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය සඳහා ඵලදායී ලෙස සහභාගී වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන්නේ නම්, භාණ්ඩාගාර බැඳුම්කරවලින් ඒ අරමුදල් වෙත ලැබුණු හෝ ඒවායින් උපයන ලද ලැබීම්වල සහ ලාභවල කොටස මත 14% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.

(ඒ) ලාභාංශ – 15%

6. වාර්තාව ගොනු කිරීමේ ක්‍රියාවලිය

2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතෙන් සංශෝධිත දේශීය ආදායම් පනතේ 113 (1ආ) වගන්තිය ප්‍රකාරව 2023 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන තක්සේරු වර්ෂයේ සිට සංස්ථාපිත ආදායම් වාර්තා ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ගොනු කිරීම අනිවාර්ය වේ.

ඊ-ගොනු කිරීම සඳහා දේශීය ආදායම් වෙබ් අඩවිය හරහා පහසුකම් සකස් කර ඇත (www.ird.gov.lk)

6.1 වාර්තාව භාර දිය යුතු නියමිත දිනය

2026 නොවැම්බර් 30 වන දින ආදායම් වාර්තාව භාරදිය යුතු නියමිත දිනය වේ. කෙසේ වෙතත් දෙපාර්ශවයටම වඩාත් පහසු සහ

කාර්යක්ෂම ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා, බදු ගෙවන්නන්ට නියමිත දිනට පෙර වාර්තා ඉදිරිපත් කරන ලෙස දිරිගන්වනු ලැබේ.

6.2 වාර්තාව භාරදීම

බදු ගෙවන්නන් විසින් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ආදායම් වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා වෙත, සියලුම උඩුගත කරන ලද ඇමුණුම් ඇතුළුව ඊ-ගොනු කිරීම හරහා ඉලෙක්ට්‍රොනික ක්‍රමයට භාරදිය යුතුය.

6.3 බද්ද ගෙවීම

දේශීය ආදායම් පනතේ 82 වන වගන්තියෙහි විධිවිධාන පරිදි බදු අය කළ හැකි ආදායම් මත බද්ද, රඳවාගැනීම මගින්, වාරික මගින් හෝ තක්සේරු කිරීම මත ගෙවනු ලැබිය යුතුය. දේශීය ආදායම් පනතේ 90 වන වගන්තිය ප්‍රකාරව, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ත්‍රෛමාසික වාරික පහත දැක්වෙන පරිදි ගෙවා නිබිය යුතුය.

වාරිකය	නියමිත දිනය (දින හෝ පෙර)	ගෙවීම් කේතය
1	2025 අගෝස්තු 15	25261
2	2025 නොවැම්බර් 15	25262
3	2026 පෙබරවාරි 15	25263
4	2026 මැයි 15	25264

තක්සේරු වර්ෂය තුළ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් උයපාගත් හෝ උපයා ගැනීමට අපේක්ෂිත ලාභ, වාරික බදු ලෙවීම තීරණය කිරීමේදී නොසැලකිය යුතුය.

තක්සේරු ගෙවීම් පහත පරිදි ගෙවා නිබිය යුතුය.

තක්සේරුව	නියමිත දිනය (දින හෝ පෙර)	ගෙවීම් කේතය
ප්‍රාග්ධන ලාභ මත	උපලබ්ධි වන දිනයෙන් පසුව එළඹෙන මාසයේ	25040 සිට 26030 (ගනුදෙනුවේ මාසය අනුව

		කේතය වෙනස් වේ.)
ප්‍රාග්ධන ලාභ නොවන බදු අය කළ හැකි ආදායම මත	2026 සැප්තැම්බර් 30	25260

බදු ගෙවන්නකු නියමිත දිනට බදු ගෙවීමට අපොහොසත් වන විට, නොගෙවූ බදු අයකර ගැනීමට පියවර ගැනීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් දරන ලද ඕනෑම පිරිවැයක් සඳහා බදු ගෙවන්නා යටත් වේ.

7 පොලී හා දණ්ඩන

7.1 ප්‍රමාද හා අඩුවෙන් ගෙවීම මත පොලී හා දණ්ඩන.

- නියමිත දිනට නොගෙවන ලද බදු මුදලක් වේ නම්, එම ප්‍රමාණය මත බද්ද ගෙවිය යුතු නියමිත දිනයේ සිට බද්ද ගෙවනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා පොලිය සඳහා බදු ගෙවන්නා යටත් වේ. මාසයකට හෝ මාසයකින් කොටසකට පොලී අනුප්‍රමාණය 1.5% වන අතර එය මාසිකව ගණනය කරනු ලැබේ.

- බදු කාලසීමාව සඳහා ගෙවිය යුතු බද්ද සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ගෙවීමට තැනැත්තකු අපොහොසත්වීම, නියමිත බද්දෙන් 20% කට සමාන දණ්ඩනයකට යටත් වේ (දේශීය ආදායම් පනත මගින් නියම කර ඇති පරිදි නොගෙවන ලද). තවද, දේශීය ආදායම් පනත යටතේ නියම කරන ලද වාරික ගෙවීමට අපොහොසත් වන්නේ නම්, ගෙවිය යුතු නමුත් නොගෙවන ලද බදු මුදල් ප්‍රමාණයෙන් 10% ට සමාන ප්‍රමාණයක දණ්ඩනයකට යටත් වේ.

7.2 බදු වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත්වීම මත දණ්ඩන.

2026 නොවැම්බර් 30 දින හෝ එදිනට පෙර, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වන තැනැත්තකු පහත ඒවායින් වැඩි අගය හා සමාන වන දණ්ඩනයකට යටත් වේ.

අ) ගෙවීමට ඇති බදු මුදලින් 5% සමග, ගොනු කිරීමට අපොහොසත්වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණයෙන් 1% සහ

ආ) රුපියල් 50,000/= සහ ගොනු කිරීමට අපොහොසත්වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා රුපියල් 10,000/= බැගින්.

7.3 වෙනත් දණ්ඩන නීති විධිවිධාන අදාළ කරගැනීම

(අ) දණ්ඩන

- දේශීය ආදායම් පනතේ 180 වන වගන්තිය ප්‍රකාරව (නොසැලකිලිමත් ලෙස හෝ වංචනික ව අඩුවෙන් කරන ලද ගෙවීම) අසත්‍ය ප්‍රකාශයක් හෝ බදු වාර්තාවක වැදගත් දෙයක් අතහැර තිබීම හේතුවෙන් චේතනාන්විත ව හෝ නොසැලකිලිමත් ලෙස බදු අඩුවෙන් ගෙවන (හෝ අඩුවෙන් ගෙවා ඇති) බදු ගෙවන්නන් හට දණ්ඩනයක් පැනවිය හැකිය. අඩුවෙන් කරන ලද ගෙවීමේ ප්‍රමාණය මත දණ්ඩන මුදල පදනම් වේ. අඩුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට වඩා වැඩි වන්නේ නම් හෝ අදාළ කාලසීමාව සඳහා එම තැනැත්තාගේ බදු බැඳීමෙන් 25%කට වඩා වැඩි වන්නේ නම් අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 75% ප්‍රමාණයක දණ්ඩනයකට යටත් විය යුතුය. එසේ නොවන්නේ නම්, දණ්ඩනය අඩුවෙන් කරන ලද ගෙවීමෙන් 25% කි.

- දේශීය ආදායම් පනතේ 181 වගන්තිය ප්‍රකාරව (අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ) බදු නිලධරයකු වෙත අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ සැපයීම මත දණ්ඩන පනවයි. (180 වන වගන්තිය යටතේ දණ්ඩන පනවා නොමැති නම්) දණ්ඩන මුදල රුපියල් 50,000 ක් හෝ ඒ මත පදනම් ව තක්සේරු කරනු ලැබිය හැකි ප්‍රමාණය යන්නෙන් වැඩි අගයට සමාන වේ. (හෝ ආපසු ගෙවන ප්‍රමාණය අඩු වීම).

- දේශීය ආදායම් පනතේ 182 වන වගන්තිය (ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වීම) ප්‍රකාරව නිසි ලියවිලි පවත්වාගෙන යාමට අපොහොසත් වීම මත දණ්ඩනය දිනකට රුපියල් 1,000 කි.

- දේශීය ආදායම් පනතේ 86 වන වගන්තියේ (7) වන උපවගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ව දක්වනු ලබන කාර්යපටිපාටිය ට අනුකූල ව කටයුතු කිරීම පැහැර හරින යම් මූල්‍ය ආයතනයක් රුපියල් 50,000/- නොඉක්මවන මුදල් ප්‍රමාණයක දණ්ඩනයකට යටත් විය යුතු ය.

(අා) අපරාධ නඩු කටයුතු

- දේශීය ආදායම් පනතේ 187 වන වගන්තිය ප්‍රකාරව (ආධාර දීම හා අනු බල දීම) දේශීය ආදායම් පනත යටතේ අපරාධමය වරදක් සිදු කිරීමට වෙනත් තැනැත්තෙකුට චේතනාන්විත ව ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ, සහාය වන්නා වූ, උපදෙස් දෙන්නා වූ, උනන්දු කරන්නාවූ හෝ පොළඹවන්නා වූ යම් තැනැත්තෙකු වරදකරු කරනු ලබූ විට එම තැනැත්තා විසින් එම වරද සිදුකර ඇති පරිද්දෙන් එම දණ්ඩනයටම යටත් විය යුතුය.

- 189 වගන්තිය (බදු ගෙවීම මඟ හැරීම) ප්‍රකාරව බදු තක්සේරු කිරීම, ගෙවීම හෝ එකතු කිරීම චේතනාන්විත ව මගහරිනු ලබන හෝ මගහැරීමට තැත්කරනු ලබන හෝ තැනැත්තකු, වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් 10,000,000 ක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ එම දෙකටම ඔහු යටත් විය යුතුය.

- 190 වන්නිය (බදු පරිපාලනයට බාධා කිරීම) ප්‍රකාරව දේශීය ආදායම් පනත පරිපාලනය කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට චේතනාන්විත ව බාධා කරනු ලබන හෝ බාධා කිරීමට තැත් කරනු ලබන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් 1,000,000 ක දඩයකට, හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ එම දඬුවම් දෙකටම යටත්වේ. වාර්තාවක් ගොනුකිරීම පැහැර හරිනු ලබන විට, යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශයක් බදු නිලධරයකු වෙත කරනු ලබන විට, නියම කරන ලද වාර්තා පවත්වා ගෙන යාම පැහැර හරිනු ලබන විට, හෝ අන්‍යාකාරයෙන් බදු නිශ්චය කිරීමට, තක්සේරු කිරීමට හෝ එකතු කිරීමට බාධා කරනු ලබන විට බදු පරිපාලනය කිරීමෙහිලා බාධා කරන ලද බවට සැලකිය යුතුය. අදාල බාධා කිරීම එම තැනැත්තාගේ බද්දක් එකතු කිරීම සම්බන්ධයෙන්

නොවුවද, එම තැනැත්තා බදු පරිපාලනයට බාධා කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු වේ.

- වගන්තිය 190 අ වගන්තිය (වංචනික ලෙස සකස් කරන ලද හෝ සහතික කරන ලද ලේඛන) ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා යම් ලේඛනයක් හෝ තොරතුරක් වංචනික ව සකස් කරනු ලබන හෝ ලේඛනයක් වංචනික ව සහතික කරන තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව රුපියල් 1,000,000 ක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාල සීමාවක් යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.

මෙම මාර්ගෝපදේශයෙහි සිංහල හෝ දෙමළ පරිවර්තනය දේශීය ආදායම් දෙපාර්තමේන්තු (IRD) වෙබ් අඩවිය - www.ird.gov.lk මගින් බා ගත කළ හැකිය.

ආදායම් වාර්තා ආකෘති පත්‍ර www.ird.gov.lk හරහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් බා ගත හැක.

විශේෂ සටහන්

ඉහත මාර්ගෝපදේශයන්ට අමතරව, **www.ird.gov.lk** යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කලට ආදායම් බදු සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කිරීමට බදු ගෙවන්නන්හට මෙමඟින් උපදෙස් දෙනු ලැබේ.

වැඩි විස්තර ලබා ගැනීම සඳහා පහත දුරකථන අංක අමතන්න.

1. 1944 -දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානය
2. 011-2 134 200 -ජ්‍යෙෂ්ඨ කොමසාරිස් - උපදේශන හා ප්‍රවර්ධන, නිශ්කාශන හා විධාන අංශය
3. 011-2 134 250 -කොමසාරිස් - නිශ්කාශන හා විධාන අංශය
4. 011-2 134 251 -කොමසාරිස් - උපදේශන හා ප්‍රවර්ධන අංශය
5. දේශීය ආදායම් සියලුම නගරබද කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාලවල කොමසාරිස්වරුන්